සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2016**

| | | |
|---|---|---|
| කෘෂි විද්‍යාව I<br>விவசாய விஞ்ஞானம் I<br>Agricultural Science I | 08 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොද දක්වන්න.**

**1.** පැරණි වැව්වල අඩංගු ජල ප්‍රමාණය මනිනු ලැබුයේ,
(1) වාන් දොරටුව මගිනි.
(2) සොරොව්ව මගිනි.
(3) බිසෝකොටුව මගිනි.
(4) රළපනාව මගිනි.
(5) දියකැට පහණ මගිනි.

**2.** පසක pH අගය 5.0 යන්නෙන් දැක්වෙන්නේ පාංශු ප්‍රතික්‍රියාව
(1) ආම්ලික බව ය.
(2) උදාසීන බව ය.
(3) ක්ෂාරීය බව ය.
(4) අධික ලෙස ආම්ලික බව ය.
(5) අධික ලෙස ක්ෂාරීය බව ය.

**3.** ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකට උදාහරණයක් වනුයේ,
(1) මට්ටම් පෝරුව.
(2) රොටවේටරය.
(3) තැටි නඟුල.
(4) තැටි පෝරුව.
(5) දැති පෝරුව.

**4.** මුල් ඇද්දවීම සඳහා බහුලව යොදා ගන්නා ක්‍රමය වනුයේ,
(1) කප්පාදුව.
(2) පොතු වළලු ගැසීම.
(3) රිකිලි බද්ධය.
(4) අංකුර බද්ධය.
(5) අතු බැඳීම.

**5.** නිර්වායු තත්ත්ව යටතේ කුඹුරක පසකින් වායු ආකාරයෙන් නයිට්‍රජන් පොහොර හානි වනුයේ,
(1) තිර වීමෙනි.
(2) නයිට්‍රීකරණය වීමෙනි.
(3) වාෂ්පශීලනය වීමෙනි.
(4) නයිට්‍රීහරණය වීමෙනි.
(5) ඇමෝනිකරණය වීමෙනි.

**6.** පසෙහි සිටින ගැඩවිලි පණුවන්
(1) පසෙහි සරු බව අඩු කරයි.
(2) පසෙහි සරු බව වැඩි කරයි.
(3) ශාකවලට හානි කරයි.
(4) ශාකවල රෝග ඇති කරයි.
(5) ශාකවල පෝෂක ඌනතා ඇති කරයි.

**7.** මැදරට තෙත් කලාපයේ පිහිටි ගොවිපොළක සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 3 300 ඉක්මවයි. මෙම ගොවිපොළ අයත් වන කෘෂි පාරිසරික කලාපය වනුයේ,
(1) IL1c ය.
(2) IM2b ය.
(3) WL1a ය.
(4) WU2b ය.
(5) WM1a ය.

**8.** අතු කැබලි මුල් ඇද්දවීම සඳහා වඩාත් සුදුසු ප්‍රචාරක ව්‍යුහය වනුයේ,
(1) ලී පටි නිවාසය (lath house) වේ.
(2) පොලිතීන් උමග (poly tunnel) වේ.
(3) හරිතාගාරය (green house) වේ.
(4) මිහිදුම් ප්‍රචාරකය (mist propagator) වේ.
(5) සූර්ය විකිරණ නිවාසය (solar radiator house) වේ.

**9.** හරිත ශාකවල අන්තර්පර්ව ප්‍රදේශවල සෛල දික්වීම සිදු වනුයේ,
(1) සයිටොකයනින් මගිනි.
(2) එතිලීන් මගිනි.
(3) ගිබෙරිලීන් මගිනි.
(4) ඇබ්සිසික් අම්ලය මගිනි.
(5) ඉන්ඩෝල් ඇසිටික් අම්ලය මගිනි.

**10.** මොනොක්‍රොටපස් කෘමිනාශකය අඩංගු බෝතලයක අලවා ඇති ලේබලයේ පහළ දාරයේ වර්ණය විය යුත්තේ,
(1) රතු ය.
(2) නිල් ය.
(3) කොළ ය.
(4) සුදු ය.
(5) කහ ය.

[දෙවැනි පිටුව බලන්න.

**11.** ටෙට්‍රාසෝලියම් ක්ලෝරයිඩ් (TZ) පරීක්ෂාව සිදු කරන්නේ
(1) බීජ ජීව්‍යතාව මැනීමට ය. (2) බීජ වර්ධනය මැනීමට ය.
(3) පරපරාගණය වූ ප්‍රමාණය මැනීමට ය. (4) බීජ සුප්තතාව මැනීමට ය.
(5) බීජ පරිණත බව මැනීමට ය.

**12.** විෂමයෝගී නමුත් සමජාතීය ගහනයකට උදාහරණයක් වනුයේ,
(1) ක්ලෝනයයි. (2) නුමුහුම් පෙළයි.
(3) දෙමුහුම් ප්‍රභේදයයි. (4) කෘත්‍රිම ප්‍රභේදයයි.
(5) විවෘත පරාගිත ප්‍රභේදයයි.

**13.** ශාක ජාන සම්පත් බහිෂ්-ස්ථානීය (*ex-situ*) ව සංරක්ෂණයට උදාහරණයක් වනුයේ,
(1) යාල වනෝද්‍යානයයි. (2) සිංහරාජ වනාන්තරයයි.
(3) මහමෙව්නා උයනයි. (4) නිල්ගල ඖෂධ උයනයි.
(5) හග්ගල උද්භිද උද්‍යානයයි.

**14.** අනියත නිදානයක් සහිත නිදන්ගත වකුගඩු රෝගය (CKDu) ට දායක වන්නේ යැයි සැක කිරීම නිසා ශ්‍රී ලංකාවේ භාවිතය සීමා කරන ලද කෘමිනාශකයක් වනුයේ,
(1) ප්‍රොපනිල් ය. (2) පැරාක්වට් ය. (3) පයිරෙත්‍රොයිඩ් ය.
(4) කාබොෆියුරාන් ය. (5) ග්ලයිපොසේට් ය.

**15.** නීති මගින් ශාක රෝග වැළැක්වීම හඳුන්වන්නේ,
(1) ශෂ්‍ය විද්‍යාත්මක පාලනය ලෙස ය. (2) රසායනික පාලනය ලෙස ය.
(3) ශාක නිරෝධායනය ලෙස ය. (4) ජෛව විද්‍යාත්මක පාලනය ලෙස ය.
(5) රෝග ප්‍රතිරෝධීතාව ලෙස ය.

**16.** කෙටි ම කාලයක දී ගොවිපොළ සතෙකුගේ නිෂ්පාදන හැකියාව වැඩි දියුණු කිරීමට යොදා ගත හැකි අභිජනන ක්‍රමය වනුයේ,
(1) වරණය ය. (2) සහාභිජනනය ය.
(3) පෙළ අභිජනනය ය (4) දෙමුහුම් අභිජනනය ය.
(5) පෙළ අභිජනනයේ සහ වරණයේ සුසංයෝගය ය.

**17.** කුකුළු ආහාර සලාකවලට යොදාගන්නා ප්‍රෝටීන පරිපූරක කිහිපයකට උදාහරණ වනුයේ,
(1) සහල් නිවුඩු, ඉඳල් ඉරිඟු සහ සුනුසහල් ය.
(2) සෝයා බෝංචි අන්නය, මත්ස්‍ය අන්නය සහ මස් අන්නය ය.
(3) බඩ ඉරිඟු අන්නය, සෝයා බෝංචි අන්නය සහ සහල් නිවුඩු ය.
(4) මත්ස්‍ය අන්නය, කරවල කුඩු සහ ඇටකටු අන්නය ය.
(5) සෝයා බෝංචි අන්නය, පොල් පුන්නක්කු සහ ඉපිල් ඉපිල් කොළ අන්නය ය.

**18.** 'ඇමෙරිකානු පංතිය' ට අයත් කුකුල් වර්ග කිහිපයක් වනුයේ,
(1) වයිට් ප්ලිමත් රොක්, බ්‍රහ්මා සහ ඇම්රොක් ය.
(2) වයිට් ලේගෝන්, බ්‍රවුන් ලේගෝන් සහ ඇන්කෝනා ය.
(3) කෝනිෂ්, වයිට් ප්ලිමත් රොක් සහ ලයිට් සසෙක්ස් ය.
(4) රෝඩ් අයිලන්ඩ් රෙඩ් (ආර් අයි ආර්), ඔස්ට්‍රාලෝප් සහ නිව්හැම්ප්ෂයර් ය.
(5) රෝඩ් අයිලන්ඩ් රෙඩ් (ආර් අයි ආර්), නිව්හැම්ප්ෂයර් සහ වයිට් ප්ලිමත් රොක් ය.

**19.** බිත්තර දමන කිකිළියන් 1000 ක රංචුවක් සඳහා අවශ්‍ය ප්‍රශස්ත බිත්තර දමන කැදලි සංඛ්‍යාව,
(1) 50 කි. (2) 100 කි. (3) 150 කි. (4) 200 කි. (5) 250 කි.

**20.** ගව පට්ටියක සිටින වසු පැටවුන්ට දළ ආහාර හඳුන්වා දිය යුත්තේ උන්ගේ වයස,
(1) මාස එකක් වන විට ය. (2) මාස දෙකක් වන විට ය.
(3) මාස තුනක් වන විට ය. (4) මාස හතරක් වන විට ය.
(5) මාස පහක් වන විට ය.

**21.** කිරි උණ යනු,
(1) වෛරස් රෝගයකි. (2) පරපෝෂිත රෝගයකි.
(3) බැක්ටීරියා රෝගයකි. (4) පරිවෘත්තික රෝගයකි.
(5) ඌනතා රෝගයකි.

**22.** කිරි ගවදෙනකගේ කිරි මුදාහැරීම සඳහා බලපාන හෝමෝනය වනුයේ,
(1) ඉන්සියුලින් ය. (2) ඊස්ට්‍රජන් ය. (3) ඔක්සිටෝසින් ය.
(4) ප්‍රෝලැක්ටින් ය. (5) ප්‍රොජෙස්ටෙරෝන් ය.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**23.** ආහාරමය ලිපිඩ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) ශාකමය තෙල් කොලෙස්ටරෝල්වලින් පොහොසත් වේ.
(2) පොල් තෙල් අසංතෘප්ත මේද අම්ලවලින් පොහොසත් වේ.
(3) බහු අසංතෘප්ත (polyunsaturated) මේද අම්ල මානව සෞඛ්‍යය දියුණු කරයි.
(4) සියලු ම මේද අම්ල අනිවාර්යයෙන් ම ආහාර මගින් ලබා ගත යුතු ය.
(5) කිරි මේදය, මිනිස් සිරුර තුළ අහිතකර කොලෙස්ටරෝල් නිපදවීමට අනුබල නොදේ.

**24.** කිසියම් ව්‍යාපාරයක 'පෞද්ගලික අංශයේ සමාජයීය වගකීම (Corporate Social Responsibility)' යනු,
(1) සියලු ම ව්‍යාපාරික කටයුතුවල දී අවංක වීම ය.
(2) රාජ්‍ය අංශය සමග සහයෝගිතාව වර්ධනය කර ගැනීම ය.
(3) සමාජයේ තිරසාර සංවර්ධනයට දායක වීම ය.
(4) පරිසරයට අවම හානියක් සිදු වන පරිදි ව්‍යාපාරික කටයුතු කරගෙන යාම ය.
(5) පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් සැලකිය යුතු මුදලක් වෙන් කිරීම ය.

**25.** නව නිෂ්පාදන ක්‍රමයකින් යෝගට්වල නිෂ්පාදන පිරිවැය අඩු වන්නේ නම්, එවිට යෝගට්වල
(1) ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර දෙක ම දකුණට විතැන් වේ.
(2) ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වන අතර සැපයුම් වක්‍රය වමට විතැන් වේ.
(3) ඉල්ලුම් වක්‍රය වමට විතැන් වන අතර සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.
(4) ඉල්ලුම් වක්‍රයේ වෙනසක් නොවන නමුදු සැපයුම් වක්‍රය වමට විතැන් වේ.
(5) ඉල්ලුම් වක්‍රයේ වෙනසක් නොවන නමුදු සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.

**26.** කෘෂිකර්මයට සම්බන්ධ පහත අණපනත් සලකන්න.
A - 2003 අංක 22 දරණ බීජ පනත
B - 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත
C - 1999 අංක 35 දරණ පැළෑටි සංරක්ෂණ පනත
D - 1996 අංක 24 දරණ පාංශු සංරක්ෂණ පනත
මේවා අතුරෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නියාමනය කෙරෙන අණපනත් වනුයේ,
(1) A, B සහ C පමණි.
(2) A, B සහ D පමණි.
(3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D සියල්ල ම ය.

**27.** පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) වායුගෝලීය වාතයේ ජල වාෂ්ප අඩංගු නොවේ.
(2) රාත්‍රි කාලයේ දී වාතයට වැඩිපුර ජල වාෂ්ප දරා සිටිය හැකි ය.
(3) සිසිල් වාතයට වඩා උණුසුම් වාතයට වැඩිපුර ජල වාෂ්ප දරා සිටිය හැකි ය.
(4) උණුසුම් වාතයට වඩා සිසිල් වාතයට වැඩිපුර ජල වාෂ්ප දරා සිටිය හැකි ය.
(5) සිසිල් වාතයට සහ උණුසුම් වාතයට සැමවිට ම සමාන ජල වාෂ්ප ප්‍රමාණයක් දරා සිටිය හැකි ය.

**28.** පසට බලපාන සාධක කිහිපයක් පහත දැක්වේ.
A - අධික වර්ෂාපතනය
B - අකාබනික පොහොර යෙදීම
C - හේන් ගොවිතැන
ඉහත සාධක අතුරෙන් පසක ආම්ලීකරණයට හේතු වනුයේ,
(1) A පමණි.
(2) B පමණි.
(3) A සහ B පමණි.
(4) B සහ C පමණි.
(5) A, B සහ C සියල්ල ම ය.

**29.** යකඩ හා මොලිබ්ඩිනම් වැදගත් වන්නේ පිළිවෙළින්,
(1) ප්‍රෝටීන සංශ්ලේෂණයට හා ශ්වසනයට ය.
(2) ජලය අවශෝෂණයට හා ධාන්‍ය පිරීමට ය.
(3) ලිපිඩ ජෛව සංශ්ලේෂණයට හා එන්සයිම ක්‍රියාත්මක කිරීමට ය.
(4) ATP සෑදීමට සහ හරිතප්‍රද සංශ්ලේෂණයට ය.
(5) හරිතප්‍රද සංශ්ලේෂණයට හා නයිට්‍රජන් තිර කිරීමට ය.

**30.** පාංශු pH පිළිබඳ වඩාත් නිරවද්‍ය ප්‍රකාශය වනුයේ,
(1) බෝග වර්ධනයට පාංශු pH අගයෙහි බලපෑමක් නැත.
(2) පාංශු pH අගය 4 ට වඩා අඩු වන විට N වල ද්‍රාව්‍යතාව අඩු වේ.
(3) පාංශු pH අගය අඩු වීම සමග Al හා Fe වල ද්‍රාව්‍යතාව වැඩි වේ.
(4) බෝගය මගින් ශාක පෝෂක අවශෝෂණය කෙරෙහි පාංශු pH අගයෙහි බලපෑමක් නැත.
(5) බොහෝ බෝගවල වර්ධනය සඳහා පාංශු pH අගය 7 ට වඩා ඉහළ අගයක් ගැනීම වැදගත් ය.

**31.** කාබනික පොහොර පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) එය ඉක්මනින් පෝෂක නිදහස් කරයි.
(2) පහත් බිම් වී වගාව සඳහා එය යෙදිය නොහැකි ය.
(3) එය අකාබනික පොහොර සමග නොයෙදිය යුතු ය.
(4) එහි අඩංගු පෝෂක ප්‍රමාණය අකාබනික පොහොරෙහි අඩංගු පෝෂක ප්‍රමාණයට වඩා වැඩි ය.
(5) මිශ්‍රව යෙදූ විට අකාබනික පොහොරවල, පොහොර භාවිත කාර්යක්ෂමතාව වැඩි වේ.

**32.** පහත සඳහන් වන්නේ තවාන් පාත්ති සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.
A - වැලි තවාන් පාත්ති ප්‍රධාන වශයෙන් භාවිත කරන්නේ බීජ ප්‍රචාරණයට ය.
B - උස් පාත්ති ප්‍රධාන වශයෙන් භාවිත වෙන්නේ තෙත් කාලයේ දී ය.
C - ගිලුණු පාත්ති උඩරට ප්‍රදේශවල සුලභ ය.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A පමණි. (2) A සහ B පමණි. (3) A සහ C පමණි.
(4) B සහ C පමණි. (5) A, B සහ C සියල්ල ම ය.

**33.** ක්ෂුද්‍ර ජල සම්පාදනය පිළිබඳ ව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - අඩු ජල ප්‍රමාණයක් භාවිතයෙන් ඉහළ බෝග නිෂ්පාදකතාවක් ලබා ගත හැකි ය.
B - පොහොර භාවිත කාර්යක්ෂමතාව වැඩි කරයි.
C - බෝගවලට සිදු වන කෘමි පළිබෝධ හානි අඩු ය.
ඉහත ප්‍රකාශ අතුරෙන් ක්ෂුද්‍ර ජල සම්පාදනයේ වාසිය/වාසි වනුයේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

**34.** බිංදු ජල සම්පාදනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) වියළි පස්වලට සුදුසු ය.
(2) මුළු ශාකය ම තෙත් කිරීමට උදව් වේ.
(3) වැලි පසක වගා කරන ලද බෝග සඳහා ඉතා ප්‍රතිඵලදායක ය.
(4) ජල සම්පාදනයට යොදා ගන්නා ජලය අවසාදිතවලින් තොර විය යුතු ය.
(5) බීජ වැපිරීමෙන් ස්ථාපනය කරන ලද බෝග සඳහා වඩාත් සුදුසු ය.

**35.** සුදුසු ජලාපවහන පද්ධතියකින්, කෘෂිකාර්මික භූමියක පසේ ජල මට්ටම පාලනය කෙරේ. මෙහි අරමුණ වනුයේ,
(1) පසේ pH අගය ඉහළ නැංවීම ය. (2) වල් පැළෑටි වර්ධනය අඩු කිරීම ය.
(3) පාංශු පෝෂක වැඩි කිරීම ය. (4) පසෙහි ක්ෂේත්‍ර ධාරිතාව පවත්වාගෙන යාම ය.
(5) පසෙහි ස්වායු ක්ෂුද්‍රජීවීන්ගේ ගහනය වැඩි කිරීම ය.

**36.** පැළෑටි ප්‍රචාරණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) බීජ ප්‍රචාරණයෙන් ලැබෙන ශාකවලින් ප්‍රවේණික ව සමාන ශාක ලැබේ.
(2) ක්ෂුද්‍ර ප්‍රචාරණය වර්ධක ප්‍රචාරණ ක්‍රමයක් ලෙස නොසැලකේ.
(3) වර්ධක ප්‍රචාරණයෙන් ලබා ගන්නා ශාක, බීජ ප්‍රචාරණයෙන් ලබා ගන්නා ශාකවලට වඩා ඉක්මනින් මේරීමට පත් වේ.
(4) බීජ අල මගින් අර්තාපල් ප්‍රචාරණය, බීජ ප්‍රචාරණ ක්‍රමයක් ලෙස සැලකේ.
(5) කෘත්‍රිම බීජ මගින් බෝග ප්‍රචාරණය, බීජ මගින් කෙරෙන ප්‍රචාරණ ක්‍රමයක් ලෙස සැලකේ.

**37.** බීජ ප්‍රරෝහණයට වඩාත් ම බලපාන සාධක වනුයේ,
(1) බීජ ජීව්‍යතාව සහ බීජයේ ප්‍රමාණය ය.
(2) බීජයේ හැඩය සහ බීජ 100 ක බර ය.
(3) බීජ සුප්තතාව සහ බීජ 100 ක බර ය.
(4) බීජයේ ප්‍රමාණය සහ බීජයේ තෙතමන ප්‍රමාණය ය.
(5) බීජ ජීව්‍යතාව සහ බීජයේ තෙතමන ප්‍රමාණය ය.

**38.** $C_4$ ශාකයක
(1) කාබොක්සිල්කරණ එන්සයිමය PEP කාබොක්සිලේස් වේ.
(2) RuBP ඔක්සිඩේස් හේතුවෙන් ප්‍රභාශ්වසනය වැඩි වේ.
(3) පළමුවෙන් අනාවරණය වන සංයෝගය ඔක්සලෝඇසිටික් අම්ලය වේ.
(4) මුදුන් මුල් පද්ධතියක් ඇති අතර පත්‍ර නාරටි වින්‍යාසය සමාන්තර ය.
(5) සම්පත් අඩු තත්ත්ව යටතේ ඵලදායීතාව $C_3$ ශාකවලට සාපේක්ෂ ව අඩු ය.

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**39.** වසර ගණනාවක් තිස්සේ නැවත නැවතත් එකම පළිබෝධනාශකය යෙදීම නිසා, එම පළිබෝධනාශකයේ පළිබෝධ විනාශ කිරීමේ කාර්යක්ෂමතාවය ක්‍රමයෙන් හීන වන බව නිරීක්ෂණය කර ඇත. මේ සඳහා හොඳ ම පැහැදිලි කිරීම වනුයේ,
(1) රසායනික අණු බිඳ වැටීම නිසා ඕනෑම රසායනිකයක ප්‍රබල බව යම් කාලයකට පසුව අඩු වේ.
(2) පළිබෝධනාශක නිෂ්පාදකයන් සිය ලාභය වැඩි කර ගැනීම සඳහා පළිබෝධනාශක වඩ වඩාත් තනුක කිරීමට පෙළඹේ.
(3) පළිබෝධ විශේෂවල ප්‍රවේණික ව ප්‍රතිරෝධී සාමාජිකයන් නොනැසී පවතින අතර ඔවුන් ප්‍රජනනයෙන් බිහි කරන ගහනය පළිබෝධනාශකයට වඩාත් ප්‍රතිරෝධී වේ.
(4) පළිබෝධනාශක යෙදූ ප්‍රදේශ මගහැරීමට කෘමි විශේෂ ඉගෙන ගන්නා බැවින් ඔවුන් රසායනිකවලට නිරාවරණය වීම ප්‍රමාණවත් නොවේ.
(5) මිනිසුන් එන්නත් මගින් රෝගයකට ප්‍රතිශක්තියක් ඇති කරගන්නා ආකාරයට ම කෘමීන් ක්‍රමික ව විෂවල බලපෑමට ප්‍රතිශක්තියක් ඇති කර ගනියි.

**40.** දිලීරකමූලය
A - ඛණිජ පෝෂක ලබා ගැනීමට ශාකයට උදව් වේ.
B - ශාකයෙන් කාබෝහයිඩ්‍රේට ලබා ගනී.
C - ශාකවලට නිසරු පසක සාර්ථක ව වර්ධනය වීමට ඇති හැකියාව වැඩි කරයි.
ඉහත ඒවා අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,
(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A හා C පමණි. (5) A, B සහ C සියල්ල ම ය.

**41.** ශ්‍රී ලංකාව තුළ හඳුනාගෙන ඇති ආක්‍රමණශීලී ආගන්තුක ශාක වනුයේ,
(1) *Mimosa pigra* සහ *Eichhornia crassipes* ය.
(2) *Ischaemum rugosum* සහ *Mimosa pigra* ය.
(3) *Cyperus rotundus* සහ *Ischaemum rugosum* ය.
(4) *Echinochloa crus-galli* සහ *Cyperus rotundus* ය.
(5) *Echinochloa crus-galli* සහ *Eichhornia crassipes* ය.

**42.** ලොකු එළුවල පසු අස්වනු හානිය හා සම්බන්ධ සාධක කිහිපයක් පහත දැක්වේ.
A - තෙලා ගන්නා ලද එළු ශ්‍රේණිගත කිරීම සහ තෝරා ගැනීම
B - එළු ගබඩා කර ඇති ගබඩාව තුළ සාපේක්ෂ ආර්ද්‍රතාව උච්චාවචනය වීම
C - ගබඩා කාලයේ දී එළු ප්‍රරෝහණය වීම
D - වගා කාලයේ දී ක්ෂේත්‍රය තුළ දුර්වල වාරි කළමනාකරණයක් පැවතීම
E - එළුවල සිටින ක්ෂුද්‍රජීවීන් ප්‍රමාණය
ඉහත සාධක අතුරෙන් පෙර අස්වනු, අභ්‍යන්තර සහ බාහිර ලෙස සැලකිය හැක්කේ පිළිවෙළින්,
(1) D, E සහ A ය. (2) B, A සහ C ය. (3) D, C සහ B ය.
(4) E, B සහ C ය. (5) D, E සහ B ය.

**43.** වී ශාකයේ වර්ධන අවධි සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - වර්ධක අවධියේ දිග ප්‍රභේදයෙන් ප්‍රභේදයට වෙනස් වේ.
B - ප්‍රජනක අවධිය, උපරිම පඳුරු දැමීමේ අවස්ථාවෙන් ආරම්භ වී සංසේචන අවස්ථාව දක්වා පවතී.
C - මේරීමේ අවධිය, සංසේචන අවස්ථාවෙන් පටන් ගන්නා අතර එහි කාල සීමාව සාමාන්‍යයෙන් දින 30ක් වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) A සහ C පමණි.

**44.** ගෙවතු වගාවක දැකිය හැකි බෝග කිහිපයක් පහත දැක්වේ.
A - පලා වර්ග
B - විසිතුරු පත්‍රික ශාක
C - අල වර්ග
D - මඤ්ඤොක්කා
E - ඇන්තූරියම්
F - කොස්
ඉහත ඒවා අතුරෙන් ආහාර සුරක්ෂිතතාව සහතික කරන බෝග වනුයේ,
(1) A, B, C සහ D පමණි. (2) A, C, D සහ E පමණි.
(3) A, C, D සහ F පමණි. (4) B, D, E සහ F පමණි.
(5) C, D, E සහ F පමණි.

**45.** ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන කර්මාන්තය දියුණු කිරීම සඳහා ඇති ප්‍රධාන විභවයක් වනුයේ,
(1) තෘණ භූමිවල සුලභතාවයි.
(2) කිරි ගවයින් ඇති කිරීමෙන් ලැබෙන අධික ලාභයයි.
(3) කිරි සහ කිරි නිෂ්පාදනවලට ඇති අධික ඉල්ලුමයි.
(4) ඉහළ අස්වනු ලබා දෙන අභිජනන සතුන් පහසුවෙන් ලබා ගැනීමට හැකි වීමයි.
(5) කිරිපිටි ආනයනය සඳහා පනවා ඇති සම්බාධකයි.


**46.** පහත සඳහන් වනුයේ ගොවිපොළ සතුන් කෙරෙහි දේශගුණික බලපෑම් සම්බන්ධ වගන්ති කිහිපයකි.
A - උණුසුම් පරිසරවල දී මස් සඳහා ඇති කරන (බ්‍රොයිලර්) කුකුළන් හතිදමන අතර දහඩිය දැමීම සිදු වේ.
B - අධික උෂ්ණත්ව යටතේ දී (heat stress) සතුන් සාමාන්‍යයෙන් වැඩිපුර ජලය පානය කරන අතර අඩුවෙන් ආහාර අනුභව කරති.
C - අධික ආර්ද්‍රතාවය යටතේ දී සතුන්ට පරිසර උෂ්ණත්වයේ බලපෑම වැඩි ය.
D - උණුසුම් පරිසර තත්ත්වයන්ට සාපේක්ෂ ව සතුන්ට ශීත පරිසර තත්ත්ව වඩාත් පහසුවෙන් දරාගත හැකි ය.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A සහ B පමණි. (2) C සහ D පමණි. (3) A, B සහ C පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D යන සියල්ල ම ය.

**47.** ආහාර ආකලන ද්‍රව්‍ය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - මේදමය ආහාර මුඩුවීම අඩු කර ගැනීමට ප්‍රතිඔක්සිකාරක උදව් වේ.
B - මොනොසෝඩියම් ග්ලූටමේට් යනු රසකාරකයක් මෙන් ම ප්‍රතිඔක්සිකාරකයකි.
C - අනුමත ආහාර වර්ණක ලෙස විවිධ වර්ණ හතරක් හඳුනාගෙන ඇත.
D - සෝඩියම් බෙන්සොයේට් සහ සෝඩියම් මෙටාබයිසල්පයිට් යනු අනුමත ආහාර පරිරක්ෂක වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A, B සහ C පමණි. (2) B, C සහ D පමණි. (3) A, C සහ D පමණි.
(4) A, B සහ D පමණි. (5) A, B, C සහ D යන සියල්ල ම ය.

● ප්‍රශ්න අංක **48** ට පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් රූප සටහන උපයෝගී කර ගන්න.



**48.** මෙම වගා ක්‍රමය,
(1) පූර්ණ භූමි ආවරණයක් ඇති නිසා පරිසර හිතකාමී වේ.
(2) බෑවුම් භූමියක වගා කර ඇති බැවින් පරිසර හිතකාමී නොවේ.
(3) බහු ස්තරවල වගා ක්‍රමයක් දක්වන බැවින් පරිසර හිතකාමී වේ.
(4) විවිධ බෝග විශේෂ රාශියක් ඇති බැවින් බෝග මාරුවකි.
(5) වාර්ෂික හෝ අර්ධ බහු වාර්ෂික බෝග රාශියක් ඇති බැවින් පරිසර හිතකාමී නො වේ.

**49.** ඒකාධිකාරය සහ පූර්ණ තරගය සම්බන්ධයෙන් වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - ඒකාධිකාරයේ දී භාණ්ඩ මිල, පූර්ණ තරගයේ දී ට වඩා අඩු ය.
B - ඒකාධිකාරයේ දී භාණ්ඩ මිල, පූර්ණ තරගයේ දී ට වඩා වැඩි ය.
C - ඒකාධිකාරයේ දී නිෂ්පාදන ප්‍රමාණය පූර්ණ තරගයේ දී ට වඩා අඩු ය.
D - ඒකාධිකාරයේ දී නිෂ්පාදන ප්‍රමාණය පූර්ණ තරගයේ දී ට වඩා වැඩි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) B සහ D පමණි.

**50.** ඉල්ලුම් ප්‍රමාණයේ සිදු වන ප්‍රතිශත වෙනස, මිලෙහි සිදු වන ප්‍රතිශත වෙනසට වඩා අඩු නම්, එවිට ඉල්ලුම
(1) නම්‍ය ය. (2) අනම්‍ය ය. (3) ඒකීය නම්‍ය ය.
(4) ශූන්‍ය නම්‍ය ය. (5) පූර්ණ නම්‍ය ය.

* * *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

කෘෂි විද්‍යාව II
விவசாய விஞ்ஞானம் II
Agricultural Science II

08 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

**විභාග අංකය :** ....................................

**උපදෙස් :**

※ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **08** කින් සහ ප්‍රශ්න **10** කින් සමන්විත වේ.

※ මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත වන අතර කොටස් **දෙකට ම** නියමිත කාලය **පැය තුනකි.**

**A කොටස — ව්‍යුහගත රචනා (පිටු අංක 2 - 7)**

※ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.

※ ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නො වන** බව ද සලකන්න.

**B කොටස — රචනා (පිටු අංක 8)**

※ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A** සහ **B** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

※ ප්‍රශ්න පත්‍රයේ **B** කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| (08) කෘෂි විද්‍යාව - II | | |
|---|---|---|
| **කොටස** | **ප්‍රශ්න අංකය** | **ලැබූ ලකුණු** |
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| **එකතුව** | | |
| **ප්‍රතිශතය** | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

**සංකේත අංක**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

මෙම තීරයේ කිසිවක් නොලියන්න

**A කොටස - ව්‍යුහගත රචනා**

**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **10** කි.)

**1.** (A) කෘෂිකාර්මික අංශය ශ්‍රී ලංකා ආර්ථිකයෙහි කොඳු නාරටිය වේ.

(i) දළ දේශීය නිෂ්පාදනය (GDP) සඳහා දායක වන කෘෂිකර්මාන්තයේ ප්‍රධාන අංශ **තුනක්** ලැයිස්තුගත කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(ii) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය මුහුණපාන ප්‍රධාන අභියෝග **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(B) ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාප 46 කට බෙදා ඇත.

(i) මෙම වර්ගීකරණයෙහි ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(ii) පහත සඳහන් ප්‍රධාන දේශගුණික කලාපවලට අයත් වන කෘෂි පාරිසරික කලාප සංඛ්‍යාව සඳහන් කරන්න.

(1) තෙත් කලාපය :..............................

(2) වියළි කලාපය :..............................

(C) පාංශු pH අගය නිවැරදි කිරීමේ වැදගත්කම සඳහන් කරන්න.

..............................

..............................

..............................

(D) පස තුළ නයිට්‍රීහරණ ක්‍රියාවලිය සිදු කරනු ලබන බැක්ටීරියා **දෙකක්** නම් කරන්න.

(i) ..............................

(ii) ..............................

(E) අක්‍රමවත් ජල කළමනාකරණ කටයුතු මගින් පාංශු හායනයට සිදු වන බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................

(ii) ..............................

(F) පාංශු ගුණාත්මය කෙරෙහි බලපාන පාංශු සාධක **තුනක්** සඳහන් කරන්න.

(i) ..............................

(ii) ..............................

(iii) ..............................

(G) අත්‍යවශ්‍ය ශාක පෝෂකයක් හඳුනා ගැනීම සඳහා යොදාගනු ලබන නිර්ණායක **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................

(ii) ..............................

(H) ස්වායු සහ නිර්වායු කොම්පෝස්ට් සැකසීමේ ප්‍රධාන වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................

(ii) ..............................

[තුන්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(I) පහත ප්‍රකාශ **සත්‍ය** (T) හෝ **අසත්‍ය** (F) දැයි සඳහන් කරන්න.

(i) ශාකයකට ක්ෂුද්‍ර පෝෂක ඉතා සුළු ප්‍රමාණයන්ගෙන් අවශ්‍ය වේ. මක්නිසාදයත් ඒවා අවශ්‍ය වනුයේ ශාකයේ වර්ධනය වෙමින් පවත්නා කොටස් සඳහා පමණි. (......)

(ii) ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා භාවිත කරන නයිට්‍රජන් පොහොර සියල්ලම අතුරෙන් වැඩිම නයිට්‍රජන් ප්‍රතිශතයක් අඩංගු වනුයේ ඇමෝනියම් සල්ෆේට්වල ය. (......)

(iii) පාංශු පැතිකඩක **B** කලාපය යනු කාබනික ද්‍රව්‍ය සහ මැටි එකතු වන උප මතුපිට කලාපය වේ. (......)

(iv) ශාකයක අත්‍යවශ්‍ය මහා පෝෂක අවශෝෂණය කරගනු ලබන්නේ පසෙන් පමණක් නොවේ. (......)

**2.** (A) වාණිජ කෘෂිකර්මාන්තයේ දී මනා ලෙස තවාන් පාලනය කිරීම වැදගත් වේ.

(i) තවාන් පාත්ති පිළියෙල කිරීමේ දී භාවිත කරනු ලබන පාංශු ජීවානුහරණ ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(ii) පහත එක් එක් ප්‍රදේශ සඳහා යෝග්‍ය තවාන් පාත්ති ආකාරයක් බැගින් සඳහන් කරන්න.

(1) නුවරඑළිය :..............................................................................

(2) දඹුල්ල :...................................................................................

(B) ඉහළ ජල සම්පාදන කාර්යක්ෂමතාවක් පවත්වා ගැනීම සඳහා බෝග ක්ෂේත්‍රවල ජල සම්පාදන පද්ධති ප්‍රවේශමෙන් සැලසුම් කළ යුතු වේ.

(i) වාර්ෂික බෝගයක් සඳහා ජල සම්පාදන පද්ධතියක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක **තුනක්** ලැයිස්තුගත කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(ii) බෝගයක ජල සම්පාදන කාලාන්තරය තීරණය කිරීමේ දී වැදගත් වන සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(C) වාණිජ මල් වගාවේ දී අලිංගික ප්‍රචාරණය බහුල වශයෙන් භාවිත කරනු ලැබේ.

(i) අලිංගික ප්‍රචාරණයේ ප්‍රධාන වාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(ii) පටක රෝපණයේ දී භාවිත කළ හැකි විවිධ ශාක කොටස් (ex - plants) **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(iii) ශ්‍රී ලංකාවේ බහුල ව භාවිත වන ස්වාභාවික වර්ධක ප්‍රචාරණ ක්‍රම **තුනක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(D) බීජ සුප්තතාව, අහිතකර දේශගුණික තත්ත්ව මගහැරීම සඳහා ශාක දක්වන පරිණාමික අනුවර්තනයක් ලෙස සැලකේ. බීජ සුප්තතාවට බලපාන අභ්‍යන්තර සාධක **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(E) (i) 'ස්වපරාගණය' අර්ථ දක්වන්න.

.......................................................................................................

.......................................................................................................

(ii) පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.

(1) ජාන සම්පත් ස්ථානීයව (*In - situ*) සංරක්ෂණය කිරීම

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(2) ජාන සම්පත් බහිෂ් - ස්ථානීයව (*Ex - situ*) සංරක්ෂණය කිරීම

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(F) බෝග වගාව සඳහා පොලිතීන් ගෘහ භාවිතයේ **එක්** වාසියක් සහ **එක්** අවාසියක් සඳහන් කරන්න.

(i) පොලිතීන් ගෘහ භාවිතයේ වාසියක්:

.......................................................................................................

(ii) පොලිතීන් ගෘහ භාවිතයේ අවාසියක්:

.......................................................................................................

(G) බෝග - සත්ත්ව සංකලනය යනු තිරසාර ගොවිතැන් පද්ධතියකි. පහත එක් එක් සංරචකය මගින් මෙම පද්ධතියේ තිරසාර බව කෙරේ දක්වන දායකත්වය සඳහන් කරන්න.

(i) බෝග

.......................................................................................................

.......................................................................................................

(ii) ගොවිපොළ සතුන්

.......................................................................................................

.......................................................................................................

3. (A) ප්‍රභාසංශ්ලේෂණය යනු පෘථිවිය මත ජීවයේ පැවැත්ම සඳහා ඉතාමත් වැදගත් වන සංසිද්ධිය වේ.

(i) ශාකයක ප්‍රභාසංශ්ලේෂණයේ ආලෝක ප්‍රතික්‍රියාව සිදු වන සෛලීය ඉන්ද්‍රිකාව නම් කරන්න.

.......................................................................................................

(ii) ප්‍රභාසංශ්ලේෂණයේ අඳුරු ප්‍රතික්‍රියාවෙහි පියවර **තුන** ලැයිස්තුගත කරන්න.

(1) .......................................................................................................

(2) .......................................................................................................

(3) .......................................................................................................

(B) ශාක රෝග, බෝග නිෂ්පාදනයෙහි ප්‍රධාන ගැටලුවක් බවට පත් වී ඇත.

(i) රෝග ත්‍රිකෝණයෙහි සංඝටක **තුන** සඳහන් කරන්න.

(1) .......................................................................................................

(2) .......................................................................................................

(3) .......................................................................................................

[පස්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


මෙම තීරයේ කිසිවක් නොලියන්න

(ii) පහත ප්‍රකාශ **සත්‍ය** (T) හෝ **අසත්‍ය** (F) දැයි සඳහන් කරන්න.

(1) නයිට්‍රජන් වැඩිපුර යෙදීම නිසා ශාකවල රෝග ග්‍රාහී බව වැඩි වේ. (......)

(2) සන්ධ්‍යා කාලයේ දී ශාකවලට ජලය යෙදීමෙන් වැළකීමට ප්‍රධාන හේතුවක් වන්නේ, ශාක රෝග ඇති වීම අඩු කිරීමයි. (......)

(C) ප්‍රශ්න (i) සිට (ii) දක්වා පිළිතුරු සැපයීමට පහත රූප සටහන් යොදා ගන්න.




(i) **P** සහ **Q** ක්‍රියාවලි නම් කරන්න.

(1) **P** :..........................................................................................

(2) **Q** :..........................................................................................

(ii) පහත අවධි නම් කරන්න.

(1) ***r*** :..........................................................................................

(2) ***s*** :..........................................................................................

(3) ***t*** :..........................................................................................

(4) ***u*** :..........................................................................................

(D) වී වැපිරීමට සාපේක්ෂව ගොයම් පැළ සිටුවීමෙහි වාසි සහ අවාසි **දෙක** බැගින් සඳහන් කරන්න.

(i) වාසි

(1) ..........................................................................................

(2) ..........................................................................................

(ii) අවාසි

(1) ..........................................................................................

(2) ..........................................................................................

(E) සිල්ලර වෙළෙඳසැල්වල විකිණීමට ඇති, පහසුවෙන් නරක් වන සුළු ආහාරවල පසු අස්වනු හානිය සිදු වීමට තුඩු දිය හැකි ක්‍රියාකාරකම් **දෙකක්** සඳහන් කරන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

(F) ආහාර නරක් වීමට බලපාන්නා වූ භෞතික සහ රසායනික සාධක **දෙක** බැගින් සඳහන් කරන්න.

(i) භෞතික සාධක

(1) ..........................................................................................

(2) ..........................................................................................

(ii) රසායනික සාධක

(1) ..........................................................................................

(2) ..........................................................................................

මෙම තීරයේ කිසිවක් නොලියන්න

**4.** (A) දේශීය ගවයින් උණුසුම් පරිසරයට දක්වන අනුවර්තන **දෙකක්** සඳහන් කරන්න.

(i) ..................................................

(ii) ..................................................

(B) සතුන් සහාභිජනනය වීමේ වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** සඳහන් කරන්න.

(i) වාසි

(1) ..................................................

(2) ..................................................

(ii) අවාසි

(1) ..................................................

(2) ..................................................

(C) තෘණ සයිලේජ් නිෂ්පාදනයේ දී, ගොවියකු තෘණ කපා තෘණ තට්ටු මතට සහල් නිවුඩු යොදමින් සහ ඒවා හොඳින් තද කරමින් සයිලෝම පිරවී ය. අවසානයේ දී පොලිතීන් මගින් සයිලෝම හොඳින් ආවරණය කරන ලදී. පහත දක්වා ඇති එක් එක් ක්‍රියාකාරකම සඳහා වූ ප්‍රධාන හේතුව බැගින් සඳහන් කරන්න.

| **ක්‍රියාකාරකම** | **ප්‍රධාන හේතුව** |
|---|---|
| (i) සහල් නිවුඩු යෙදීම | :.................................................. |
| (ii) තෘණ තද කිරීම | :.................................................. |
| (iii) පොලිතීන් මගින් ආවරණය කිරීම | :.................................................. |

(D) එළදෙනකගේ ආහාර මාර්ගයේ විවිධ කොටස් පහත දැක්වේ. ප්‍රධාන ජීර්ණ ක්‍රියාව සැලකීමේ දී එළදෙනගේ ආහාර මාර්ගයේ එක් එක් කොටසට සමාන කුකුළාගේ ආහාර මාර්ගයේ කොටස් නම් කරන්න.

| **එළදෙනකගේ ආහාර මාර්ගය** | **කුකුළාගේ ආහාර මාර්ගය** |
|---|---|
| (i) මුඛය | .................................................. |
| (ii) රූමනය | .................................................. |
| (iii) ග්‍රහණිය | .................................................. |

(E) පහත සඳහන් එක් එක් බිත්තර, රක්කවීම සඳහා තෝරා **නොගැනීමට** බලපාන ප්‍රධාන හේතුව බැගින් සඳහන් කරන්න.

| | **ප්‍රතික්ෂේප කිරීමට හේතුව** |
|---|---|
| (i) ඉතා කුඩා බිත්තර | :.................................................. |
| (ii) ඉතා විශාල බිත්තර | :.................................................. |
| (iii) අපවිත්‍ර වූ බිත්තර | :.................................................. |
| (iv) ගෝලාකාර බිත්තර | :.................................................. |

(F) ගව පැටවුන් සඳහා මුල් කිරි ආහාරයට දීමේ ප්‍රධාන වාසි/හේතු **දෙකක්** සඳහන් කරන්න.

(i) ..................................................

(ii) ..................................................

(G) රෝගී සතෙකුගේ පොදු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(i) ..................................................

(ii) ..................................................

(H) කෘෂි - ව්‍යාපාරික ව්‍යාපෘතියක ව්‍යාපාරික සැලසුමක් තිබීමේ ප්‍රධාන ප්‍රයෝජනය කුමක් ද?

..................................................

PAST PAPERS WIKI

[හත්වැනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



මෙම තීරයේ කිසිවක් නොලියන්න

(I) පහත වගුව මගින් නිෂ්පාදන ක්‍රියාවලියක විවිධ කොටස් දැක්වේ. හිස්තැන් පුරවන්න.

| විචල්‍ය යෙදවුම් ඒකක ප්‍රමාණය | මුළු නිපැයුම (TP) | ආන්තික නිෂ්පාදිතය (MP) | සාමාන්‍ය නිෂ්පාදිතය (AP) |
|---|---|---|---|
| 3 | (i) ........................ | නොදනී | 30 |
| 4 | (ii) ........................ | 18 | (iii) ........................ |
| 5 | 120 | 12 | (iv) ........................ |

* *

[අටවැනි පිටුව බලන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

කෘෂි විද්‍යාව II
விவசாய விஞ்ஞானம் II
Agricultural Science II

08 S II

## B කොටස - රචනා

**උපදෙස් :**

- ※ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- ※ අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **15** කි.)

**5.** (i) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඵලදායීතාව කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම විස්තර කරන්න.

(ii) කිරි ගව ගොවිපොළක විවිධ වර්ගයේ වාර්තා තබා ගැනීමේ වැදගත්කම උදාහරණ සහිත ව විස්තර කරන්න.

(iii) කෘෂිකාර්මික නිෂ්පාදනවලට අගය එකතු කිරීමේ සහ විවිධාංගීකරණය කරන ලද ආහාර සැකසීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

**6.** (i) පසේ සාරවත් බව වැඩි දියුණු කිරීමෙහිලා ක්ෂුද්‍රජීවීන්ගේ කාර්යභාරය පැහැදිලි කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කර ඇති කෘෂිකාර්මික සංවර්ධන වැඩ සටහන් මගින් ජාතික ආර්ථික සංවර්ධනයට ලබා දී ඇති දායකත්වය විස්තර කරන්න.

(iii) "කෘෂිකාර්මික නිෂ්පාදනය, ආනයන ආදේශනය සඳහා පමණක් නොව අපනයන ප්‍රවර්ධනය සඳහා ද අරමුණු කර ගත යුතු ය." මෙම තර්කය තහවුරු කරන රචනාවක් ලියන්න.

**7.** (i) පාංශු pH අගය කෙරෙහි බලපාන සාධක පැහැදිලි කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ භාවිත කරන මතුපිට වාරිමාර්ග පද්ධතිවල වාසි සහ අවාසි විස්තර කරන්න.

(iii) බෝග වගා ක්ෂේත්‍රයකට පළිබෝධනාශක යෙදීමේ දී අනුගමනය කළ යුතු ආරක්ෂිත ක්‍රියාමාර්ග විස්තර කරන්න.

**8.** (i) ආරක්ෂිත කෘෂිකර්මාන්තය (Protected Agriculture) සඳහා ශ්‍රී ලංකාවේ ඇති විභවය විස්තර කරන්න.

(ii) කිරි ගවයකුගේ කිරි මුදාහැරීමේ යාන්ත්‍රණය, නිවැරදි ව නම් කරන ලද රූප සටහනක් ආධාරයෙන් පැහැදිලි කරන්න.

(iii) කාබනික ද්‍රව්‍ය පසට එක් කිරීම, තිරසාර බෝග නිෂ්පාදනයට උපකාරී වන අයුරු පැහැදිලි කරන්න.

**9.** (i) වාසි සහ අවාසි සඳහන් කරමින් කුකුළන් ඇති කිරීමේ විවිධ ක්‍රම විස්තර කරන්න.

(ii) කෘෂිකර්මාන්තයේ දී ද්විතියික බිම් සැකසීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(iii) ශාක වර්ධනය සහ විකසනය සඳහා ගිබරලීනවල සම්බන්ධතාව පැහැදිලි කරන්න.

**10.** (i) 'සමෝධාන වල් පැළ පාලනය' විස්තර කරන්න.

(ii) සංරක්ෂිත කෘෂිකර්මාන්ත තුළ ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවට බලපෑ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලංකාව තුළ, එළවළුවල අධික පසු අස්වනු හානි ඇති වීමට හේතු පැහැදිලි කර ඒවා අවම කර ගැනීමට යොදා ගත හැකි ක්‍රම සඳහන් කරන්න.

※ ※ ※


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

LOL Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

# 25% OFF ALL BOOKS

Including Exercise Books,
CR Books, and B5 Books



## ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

**ORDER BOOKS FROM LOL BOOKS STORE**

0372060110 WWW.LOL.LK

071 777 4440 (WhatsApp)

**Cash On Delivery Available**

# ORDER A/L TERM TEST PAPERS, SHORT NOTES, WORKBOOKS & REVISION BOOKS

SINHALA, ENGLISH & TAMIL MEDIUM



# LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

0717774440 (WHATSAPP)

WWW.LOL.LK